මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක,
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය (CMEV) සහ
රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්‍ෂ, පැෆ්රල් සංවිධානය

## ශ්‍රී ලංකාවේ මැතිවරණ නිරීක්‍ෂණ ක්‍රියාවලිය හා එහි ගමන්මගඃ

ලොව ඕනෑම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක කේන්ද්‍රීය සාධකය ලෙස හැඳින්විය හැක්කේ මැතිවරණයයි. මැතිවරණයක් යනු කවරක්දැයි න්‍යායාත්මක ව විවිධ මානයන් ඔස්සේ විග්‍රහ කිරීමට හැකියාව පැවතිය ද මැතිවරණයක් යනු කවරක්ද යන්න පිළිබඳ ප්‍රායෝගික අවබෝධය ලොව බහුතර පුරවැසියන් පිරිසක් සතුව පවතී. ඒ අනුව බලන කල මැතිවරණක් තරම් යම් රටක පුරවැසියන් ඇඳබැඳ තබා ගන්නා වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී  භාවිතාවක් නැති තරම්ය. තමන්ට අභිමත යම් නියෝජිතයෙක් තමන් ඇතුළු පිරිසක් පාලනය කිරීම සඳහා තෝරා පත් කර ගැනීමේ සම්ප්‍රදාය 17 වන ශත වර්ෂය දක්වා ඈතට දිවෙයි. මැතිවරණයක දී සිදුවන ඉතා සරල ක්‍රියාදාමය වන්නේ පාලන තන්ත්‍රය හෙබවීම සඳහා යම් පුද්ගලයන් පිරිසක් ජනතාව විසින් තෝරා පත්කර ගැනීමට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියයි. කළින්කලට මැතිවරණ පැවැත්වීම සියලු නූතන ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යයන්හි පාලන රටාවේ අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. එහෙත් ඒ සියලු මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදී දැයි යන්න වෙනම ම විමසා බැලිය යුතු කරුණකි.

## ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණඃ

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු එක්සත් ජනපද තනාපති හා විද්වතෙක් වූ ජීන් කර්ක්පැට්‍රික් වරක් මෙලෙස සඳහන් කළේය. "ප්‍රජාතාන්ත්‍රික මැතිවරණයන් වූ කලී හුදූ සංකේතාත්මක ක්‍රියා සංතතියක් නොවේ. ඒවා තරඟකාරී, නියමිත අවස්ථාවන්හිදී සිදුවන, සියල්ලන් අන්තර්ගත වූ, ස්ථිර මැතිවරණ වන අතර    විවේචනය කිරීමට, තමන්ගේ විවේචන ප්‍රසිද්ධ කිරීමට සහ විකල්පයන් ඉදිරිපත් කිරීමට පුරවැසියන් විසින් තමන්ට ඇති අයිතිය පුළුල්ව හා නිදහසේ භුක්ති විඳිමින් ආණ්ඩුවක ප්‍රධාන තීරණ ගන්නා පුද්ගලයින් පත්කර ගන්නා ක්‍රියාවලියකි."[1] ජීන් කර්ක්පැට්‍රික්ගේ ඉහත හැඳින්වීමේ සඳහන් inclusive යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ අන්තර්කරණය හෙවත් සියලු දෙනා සහභාගී කරගැනීම යන්නයි. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක, ඉතා වැදගත් අංගයක් වන්නේ සියලු පාර්ශවයන්ගේ (Stakeholders) සහභාගීත්වය උපරිම වශයෙන් අන්තර්ගත කිරීමයි. මැතිවරණ නිරීක්‍ෂණය ද ඕනෑම මැතිවරණයක ගුණාත්මක බව වර්ධනය කරනු ලබන එක් ප්‍රබල සාධකයක් බවට පත් ව ඇත.

## මැතිවරණ නිරීක්‍ෂණයඃ

ඉහතින් සඳහන් කළ සියලුදෙනා ඇතුළත් මැතිවරණයක් තුළ (Inclusive Election) නිතැතින්ම ඇතුළත් විය යුතු එක් පාර්ශවයක් වන්නේ මැතිවරණ නිරීක්‍ෂකයන්ය. ඕනෑම මැතිවරණයක සුපිළිපන්නභාවය (Integrity) සුරැකීමෙහිලා මැතිවරණ නිරීක්‍ෂයන් ඉමහත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඊට අමතරව මැතිවරණයක් සඳහා සහභාගීත්වය දක්වන අපේක්‍ෂකයන් ද ඇතුළත් අනෙක් පාර්ශවයන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් රැකදීමට හා ප්‍රවර්ධනය කිරීමට ද මැතිවරණ නිරීක්‍ෂණය උපකාරී වේ. නිරීක්‍ෂණය (Observe) යන්න ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝශය මඟින් අර්ථගන්වා ඇත්තේ යමක් හෝ යමෙක් පිළිබඳ ඉතා සමීපව පරීක්‍ෂාකාරී වෙමින් වාර්තා කළයුතු යැයි හැගෙන යම් සුවිශේෂි කරුණක් වේ නම් ඒවා නිසි ලෙස සඳහන් කිරීමේ ක්‍රියාවයි. ඒ අනුව මැතිවරණ ක්‍රියාදාමයක ගමන්මග හා එහි දක්නට ලැබෙන සුවිශේෂතා ඉස්මතු කොට දැක්වීම මැතිවරණ නිරීක්‍ෂණයක දී අපේක්ෂිත මුලික කාර්යය වන්නේය. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මෙසේ සඳහන් කරයි.

---

[1] Jeane Kirkpatrick, Scholar and former U.S ambassador to the United Nations, "Democratic election are not merely symbolic …… They are Competitive, periodic, inclusive, definitive elections in which the chief decision makers in a government are selected by citizens who enjoy broad freedom to criticize government, to publish their criticism and to present alternatives.

*2 වන වගන්තියේ සඳහන් කිසිම ප්‍රභේදයකින් තොරව ද අසාධාරණ සීමා කිරීම් වලින් තොරවද*
*(අ) මහජන කටයුතු විෂයෙහි ලා කෙළින්ම හෝ නිදහස්ව තෝරා ගනු ලබන නියෝජිතයන් මගින් හෝ සහභාගි වීමට.*
(ආ) නිදහස් හා සමාන ඡන්දයෙන් සිදු කළ යුතු වූද, තෝරන තැනැත්තන්ගේ නිදහස් කැමැත්ත ප්‍රකාශ කිරිම සහතික කෙරෙමින් රහස් ඡන්දයෙන් පැවැත්විය යුතු වූ ද නිර්ව්‍යාජ වාර මැතිවරණ වලදී ඡන්දය දීමට සහ තෝරා ගනු ලැබීමට.
(ඇ) සමානාත්මතාවයේ පොදු නියමයන් මත සිය රටේ රාජ්‍ය සේවයට ඇතුළු වීමට සෑම පුරවැසියෙකුටම අයිතිය සහ අවස්ථාව තිබිය යුතුය[2]

රටක ඕනෑම පුරවැසියෙකුට එරටේ පැවැත්වෙන මැතිවරණයක දී තමන් අභිමත අයුරකින් ඊට සක්‍රීයව සහභාගී වීම මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය මඟින් තහවුරු කර ඇත්තේ එලෙසිනි.

## මැතිවරණ කළමනාකරණ ආයතන (මැ.ක.ආ) හා මැතිවරණ නිරීක්ෂණයඃ

මැතිවරණ කළමනාකරණ ආයතන (Electoral Management Body – EMB) යනු යම් රටක මැතිවරණ පැවැත්වීම හෝ ඒ හා සබැඳි ක්‍රියාවලිය නිසිලෙස පැවැත්වීම සඳහා නීතිමය බලතල සහිතව පිහිටුවා ඇති ආයතනයයි. ඊට රටේ බලපවත්නා නීති ප්‍රකාරව මැතිවරණ පැවැත්වීමේ නීතිමය වගකීම ද ඇත. මෙරටේ එකී බලතල සහිතව පැවති ආයතනය වූයේ මැතිවරණ දෙපාර්තමේන්තුවයි. වසර 2015 නොවැම්බර් මස 13 වැනි දින එය මැතිවරණ කොමිෂන් සභාව බවට පත් විය.

ඒ අනුව මෙරටේ නිල මැතිවරණ කළමණාකරණ ආයතනය වන්නේ මැතිවරණ කොමිෂන් සභාවයි. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය සාමාන්‍යයෙන් සිදුවන්නේ මැතිවරණ කළමනාකරණ ආයතන වලට පරිබාහිරව,ස්වාධීන පදනමකිනි. එසේ වුවත් මැතිවරණයට අදාළ නීතිමය රාමුව තුළට මැතිවරණ නිරීක්ෂණය ද එක් කර ගැනීම සාමාන්‍යයෙන් සිදු වන්නකි. එපමණක් නොව මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි ජනතා විශ්වාසය ගොඩනැංවීමෙහිලා මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාදාමය වඩාත් ශක්තිමත් කිරීම මැතිවරණ කළමනාකරණ ආයතනය සතු වගකීමකි. මැතිවරණ නිරීක්ෂණයට අදාළ නිල අවසරය ලබා දීම, මැතිවරණ ක්‍රියාවලියට හා ඡන්දය භාවිතා කිරීම ඇතුළු ක්‍රමවේද පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා උපයෝගී කර ගතහැකි මෙවලම් ආදිය සපයමින් පුහුණු අවස්ථා උදා කිරීම ආදිය මැතිවරණ කළමනාකරණ ආයතන මඟින් සැළසිය හැකි සේවාවන්ය.

## මැතිවරණ චක්‍රය හා මැතිවරණයේ කොටස්කරුවන්ඃ

මැතිවරණ චක්‍රය යනු මැතිවරණ ක්‍රියාවලියක අන්තර්ගත විය යුතු මූලික සාධක පිළිබිඹු කරනු ලබන, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් ද ඇතුළත් ප්‍රධාන මෙවලමකි. එය මූලික අවධීන් තුනකට බෙදා දක්වා ඇත.

---

[2] 1. Everyone has the right to take part in the government of his country, directly or through freely chosen representatives.
2. Everyone has the right of equal access to public service in his country.
3 The will of the people shall be the basis of the authority of government, this will shall be expressed in periodic and genuine elections which shall be by universal and equal suffrage and shall be held by secret vote or by equivalent free voting procedures.




- ✓ පූර්ව මැතිවරණ අවධිය
- ✓ මැතිවරණ දිනය
- ✓ පශ්චාත් මැතිවරණ අවධිය

මේ අනුව ඉහත දැක්වූ කාලසමයන් තුන තුළදී ම මැතිවරණ නිරීක්ෂණය අත්‍යාවශ්‍ය හා වැදගත් බව ඉතා පැහැදිලි කරුණකි. තවද මැ.ක.ආ. වලට, මැතිවරණ නිරීක්ෂණය වඩාත් ක්‍රමවත් කිරීම සඳහා මෙහිදී මැදිහත් විය හැක. අදාළ දැනුවත් කිරීමේ තොරතුරු හා උපදෙස් ලබාදීම මෙන්ම නිරීක්ෂකයන්ට පිළිපැදිය හැකි ආචාර ධර්ම ආදිය හඳුන්වාදීම එහිලා ගත හැකි සමහර ක්‍රියාමාර්ගයන්ය. මැතිවරණ කළමනාකරණ ආයතනය හා කවරාකාරයේ සහසම්බන්ධතාවයක් පැවතිය ද තම නිරීක්ෂණ කටයුතු අපක්ෂපාතීව හා සාධාරණව ඉටුකිරීම එකී ආයතනවල ප්‍රමුඛතම කාර්යය විය යුතුය. මැතිවරණ ක්‍රියාවලියේ විශ්වාසනීයත්වය වැඩිදුරටත් තහවුරු කර ගැනීමේදී එහි පාර්ශවකරුවන් ගෙන් ලැබෙන සහාය ඉතා වැදගත්ය. ඒ අනුව මැතිවරණ ක්‍රියාවලියේ පාර්ශවකරුවන් කවුරුන්ද යන්න පහත දක්වා ඇත. මැතිවරණ ක්‍රියාවලියක දී මෙම පාර්ශවකරුවන් ප්‍රතිපත්තිමය හා ප්‍රායෝගික යන දෙයාකාරයෙන් ම සම්බන්ධ විය හැකි අතර ඔවුන්ගේ බලපෑම් ඍජු හා වක්‍රාකාර විය හැකිය.

- ➢ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්
- ➢ මැතිවරණ කළමණාකරණ ආයතන කාර්ය මණ්ඩල
- ➢ රජයේ විධායක අංශ
- ➢ ව්‍යවස්ථාදායකය
- ➢ මැතිවරණ ආශ්‍රිත ගැටලු විසඳීමේ ආයතන
- ➢ අධිකරණ පද්ධතිය
- ➢ මැතිවරණ නිරීක්ෂකයන් - දේශීය හා ජාත්‍යන්තර
- ➢ මාධ්‍ය
- ➢ ඡන්දදායකයන්
- ➢ සිවිල් සමාජ සංවිධාන සහ
- ➢ ආධාර ප්‍රධානක ආයතන සහ මැතිවරණ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සහාය සපයන ආයතන

## <u>ශ්‍රී ලංකාවේ මැතිවරණ නිරීක්ෂණ ආයතනඃ</u>

ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද අයිතිය ලැබුණේ වසර 1931 දී වන අතර මැතිවරණ ක්‍රමවත් ව පැවැත්වීම සඳහා නිශ්චිත ආයතනයක් ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබුයේ වසර 1947 දීය. ඒ ආයතන දෙකක් වශයෙනි.[3] එදාමෙදා තුර මැතිවරණ දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් පාර්ලිමේන්තු මහ මැතිවරණ 16 ක් මෙරටේ පවත්වා ඇත. ඊට 1982 පැවති ජනමත විචාරණය ද ඇතුළත්ය. ඊට අමතරව පවත්වා ඇති අනෙකුත් මැතිවරණ ප්‍රමාණය ද ඉතා විශාලය. අතීතයේ පටන් එනම් රාජ්‍ය මන්ත්‍රණ සභාව ක්‍රියාත්මක කාලසමයේදී පවා මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා හා සම්බන්ධ සිදුවීම් වාර්තා වූ බව පෙනේ. එසේ වාර්තා වූ සමහර සිදුවීම් මැතිවරණයක පැවතිය යුතු නිදහස් හා සාධාරණ බවට හානි ගෙන දුන් බරපතල සිදුවීම් බව ද

[3] පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය මණ්ඩල (පළාත් පාලන) මැතිවරණ දෙපාර්තමේන්තුව

සඳහන් කළ යුතුය. ඒ අනුව මෙරටේ පැවති මැතිවරණ අතරින් වඩාත් සැළකිය යුතු මට්ටමේ බරපතල සිදුවීම් වාර්තා වූ මැතිවරණ ද නැත්තේ නොවේ. එවැනි සමහර මැතිවරණ වලට අදාළ වාර්තා පිරික්සීමේදී පෙනි යන්නේ, මැතිවරණයක පැවතිය යුතු නිදහස් හා සාධාරණ බව ඒවායෙහිදී දැඩි ප්‍රශ්ණාර්ථයකට ලක් කර ඇති බවයි. ඒ අතර 1999 දී පැවති වයඹ පළාත් සභා ඡන්ද විමසීම, 1982 පැවති ජනමත විචාරණය සහ 1981 දී පැවති යාපනය දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම යන ඒවා කැපී පෙණෙන අතර සමාජයේ දැඩි කතාබහට ද ලක් වී ඇත. ඊට අමතරව 2005 පැවති ජනාධිපතිවරණය මෙරටේ මැතිවරණ ඉතිහාසයට එක් වූයේ සමස්ථ පළාතක් එනම් මැතිවරණ දිස්ත්‍රික් පහක පමණ ඡන්දදායකයන් ඉතා අවම ප්‍රතිශතයක් ඡන්දය භාවිතා කරන ලද මැතිවරණයක් ලෙසිනි. එවකට උතුරු පළාත කේන්ද්‍රියව කටයුතු කළ එල්.ටී.ටී.ඊ සංවිධානය මුදාහරින ලද භීෂණයට බියෙන් තම ඡන්දය භාවිතා කිරීම සඳහා කිසිදු ඡන්දදායකයෙක් ඉදිරිපත් නොවීම අභාග්‍යසම්පන්න අත්දැකීමකි. ඊට අමතරව 1988 සහ 1989 යන කාලසීමාවන් තුළ පැවති මැතිවරණ ද පැවතියේ මැතිවරණයක පැවතිය යුතු සාමකාමී දේශපාලන පසුබිමක නොවන බව පැහැදිලි කරුණකි. එකී බොහෝ මැතිවරණ තුළදී මැතිවරණ දෙපාර්තමේන්තුවට අනුබද්ධව කටයුතු කළ නිලධාරීන් අවම පහසුකම් හා ජීවිත තර්ජන අභිමුව ප්‍රශස්ත කාර්යයභාරයක් ඉටු කර ඇති බව ද සටහන් කළ යුතුය.

## මැතිවරණ නිරීක්ෂණයේ ඓතිහාසික පසුබිම:

වසර 1977 ට පෙර මෙරටේ පැවති මැතිවරණ තුළදී එතරම් සැළකිය යුතු මට්ටමේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වී නොමැති බව පෙනී යන කරුණකි. එහෙත් 1977 ට පසුව පැවති මැතිවරණ පිළිබඳව සළකා බැලීමේදී පෙනී යන්නේ විවිධ දේශපාලන පක්ෂ මඟින් ක්‍රියාත්මක කරන ලද සංවිධානාත්මක ප්‍රචණ්ඩ ක්‍රියා ආදිය නිසා මෙරටේ සිවිල් සමාජ සංවිධාන, එලෙස පැවති මැතිවරණ නිරීක්ෂණය සඳහා අඩුවැඩි වශයෙන් දායක වීමේ ප්‍රවණතාවක් උද්ගත වූ බවයි. මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ යත් ම මැතිවරණ නිරීක්ෂණය සඳහා සිවිල් සමාජයේ පැවති උනන්දුව ද ක්‍රමයෙන් ඉහළ නැඟුණි. විශේෂයෙන්ම වසර 1965 න් පසුව පැවති ඡන්ද විමසීම් වලදී දක්නට ලැබුණු ලක්ෂණයක් වූයේ පාලන බලය ලබා ගත් දේශපාලන පක්ෂ තම ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ සාමාජිකයන්ගේ නිවෙස් ඇතුළු දේපළ වලට අලාභහානි කිරීම හා සංවිධානාත්මක ව හිරිහැර කිරීම වර්ධනය වීමයි. මෙහිදී දේශපාලනික ව ගුරුවරුන් ආදී රජයේ සේවකයන් සෘජු ඉලක්ක බවට පත් වූ අතර ආණ්ඩු පෙරළියත් සමඟ සිදු වන අනිවාර්ය අංගයක් බවට පත් වූයේ ගුරුවරුන් හට දුෂ්කර සේවා මාරුවීම් ආදිය ලබා දීමයි. එහෙත් එවැනි මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ හෝ මැතිවරණයේ සුපිළිපන්න බවට හානි වන ක්‍රියාකාරකම් නිරීක්ෂණයට සරිලන ක්‍රමවත් යාන්ත්‍රණයක් හෝ අත්දැකීමෙන් සපිරි කණ්ඩායමක්, සිවිල් සමාජය තුළින් මතු නොවී ම එහිලා මතු වූ බලවත් ගැටළුව විය. 1982 පැවැත් වූ ජනමත විචාරණයේ දිස් වූ අඩුපාඩු හරහා මෙවන් යාන්ත්‍රණයක් තිබීමේ වැදගත්කම යළිත් වරක් ප්‍රබලව මතු වන්නට විය. එහිලා පෙරමුණ ගත් පුද්ගලයන් බවට පත් වූයේ ගරු තිස්ස බාලසූරිය පියතුමා, ආචාර්ය ගොඩ්ෆ්‍රී ගුණතිලක සහ වාල්ස් අබේසේකර ඇතුළු පිරිසකි. ඊට සමගාමීව විමල් ප්‍රනාන්දු මහතා ද මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය වඩාත් ක්‍රමවත් කිරීමෙහිලා බලවත් වෙහෙසක් ගෙන ඇති බව පෙනී යයි. එකී පිරිසේ බලවත් උනන්දුව යටතේ සිවිල් සමාජ ක්‍රියාකාරීන්, "නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය" නමින් එක්ව 1988 පැවති ඡන්ද විමසීම නිරීක්ෂණයට එක් විය. එය මෙරට මැතිවරණ ඉතිහාසයේ සිවිල් සමාජ සංවිධානයක් මුල්වරට මැතිවරණ නිරීක්ෂණයට සෘජුව ම දායක වූ පළමු අවස්ථාව බවට පත් විය. එහිලා පුරෝගාමී වූ සංවිධාන වූයේ ජාතික සමගිය සඳහා වූ පුරවැසියෝ සංවිධානය, මාර්ග ආයතනය, සමාජය සහ ආගම සඳහා සංවිධානය, සර්වෝදය ආදී සිවිල් සමාජ සංවිධානයි. දේශීය හා විදේශීය නිරීක්ෂණ සංවිධාන ඒකාබද්ධව සිදු කරන මෙකී කාර්යය වඩාත් පුළුල් ක්‍රියාදාමයක් බවට පත් විය. ඒ අනුව ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේදී එවකට මැතිවරණ කොමසාරිස්වරයා වූ චන්ද්‍රානන්ද ද සිල්වා මහතා ඉතා ප්‍රශස්ත කාර්යයභාරයක් ඉටු කළ ඇති බව 1988 ජනාධිපතිවරණය වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති වාර්තාව සාක්ෂි දරයි. මෙහි පහත පළවන්නේ එකී වාර්තාවෙන් උපුටා ගත් කොටසකි.

*"ජාතික ඡන්ද විමසීම් නිරීක්ෂකයෝ - මෙම ජනාධිපතිවරණයේ නාම යෝජනා දිනයෙන් දෙසතියකට පමණ පසු මෙම ඡන්ද විමසීම නිරීක්ෂණය කළ යුතුයි. ශ්‍රී ලාංකිකයන් කණ්ඩායමක් විසින් කරන ලද යෝජනාවකට, ඡන්දදායකයන්ගේ අවධානය යොමු විය. මාර්ග ආයතනයේ අධ්‍යක්ෂක හා ජාතික සමගිය පිළිබඳ සමිතියේ විධායක උප සභාපති වූ ගොඩ්ප්‍රි ගුණතිලක මහතාගේ මූලිකත්වයෙන් යුත් මෙම කණ්ඩායම විසින් මෙම කාර්යය සඳහා රාජ්‍ය නොවන සංවිධාන 20 කට වඩා, මේ වන විටත් සම්බන්ධ කරගෙන තිබුණි. නොවැම්බර් 25 දින, කොමසාරිස්වරයා මුණගැසීමට පැමිණි ගුණතිලක මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් විසින් මේ යෝජනාව සඳහා තම එකඟත්වයත්, එය ක්‍රියාත්මක කිරීමෙහිලා මාර්ගදේශකත්වයත් ලබාදෙන ලෙස කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටියහ"[4]*

ජාත්‍යන්තර ආධාර ප්‍රදානක ආයතන හෝ දේශීය සුභ පතන්නන්, මැතිවරණ නිරීක්ෂණයන්ගේ වැදගත්කම අවබෝධ කර නොගෙන සිටි මෙකල, මෙම සිවිල් සමාජ ක්‍රියාකාරීන් මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා පෙරබිම සකස් කරන ලද්දේ යම්කිසි වේතනයක් හෝ ස්ථිර අරමුදලක පිහිටාධාරයෙන් නොවන බව සඳහන් කළ යුතුම ය.[5] එකී ක්‍රියාවලියට අදාළ රැස්වීම් සටහන් පිරික්සීමේ දී පැහැදිලි වූ කරුණක් වූයේ ඔවුන් ආරම්භක අවදියේදී බොහෝ නිරීක්ෂණ කටයුතු සඳහා වැය කොට ඇත්තේ තමන් සතු පෞද්ගලික ධනය බවයි. මැතිවරණ නිරීක්ෂණයේ ඓතිහාසික පසුබිම නිරීක්ෂණය කිරීමේදී 1999 පැවති වයඹ පළාත් සභා මැතිවරණය ආශ්‍රිතව සිවිල් සමාජය කටයුතු කරන ලද ආකාරය පිළිබඳව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ගරු කරන දෙස් විදෙස් බොහෝ දෙනෙක් දැඩි සන්ත්‍රාසයට හා භීතියට පත්කරන ලද මැතිවරණයක් වූ එකී මැතිවරණයේ පාලනය මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ගිලිහී යන්නට තරම් දේශපාලන ප්‍රචණ්ඩත්වය උත්සන්නව පැවතිණි. එහිලා එකී මැතිවරණය නැවත පැවැත්විය යුතුය යනුවෙන්[6] හා එවන් ආකාරයේ මැතිවරණ සපුරා ප්‍රතික්ෂේප කළ යුතුය යන හඬ සමාජගත කිරීමට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වැනි නිරීක්ෂණ ආයතන හා ඒකාබද්ධව කටයුතු කළ ක්‍රියාකාරීන් බොහෝ දෙනෙක් අනලස්ව කටයුතු කළහ. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, සුනන්ද දේශප්‍රිය, වරුණ කරුණාතිලක, ආචාර්ය අර්ජුන පරාක්‍රම වැන්නන් එහිලා සිදුකරන ලද්දේ ප්‍රමුඛ කාර්යභාරයකි.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (Paffrel) යනු එලෙස රටෙහි ජනතාව අගය කරනු ලැබූ විද්වත් හා ප්‍රබුද්ධ පිරිසකගෙන් සැදුම්ලත් කණ්ඩායමක්, මැතිවරණ නිරීක්ෂණය සඳහා ගන්නා ලද සාමූහික උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්වීම වඩාත් උචිතය. ඉහතින් සඳහන් කළ පුද්ගල චරිත වලට අමතරව මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ව්‍යාපාරයේ ගමන්මඟ හා එහි හැඩතල නිසි ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීම සඳහා දායක වූ පුද්ගලයන් කිහිපදෙනෙක් මෙහිලා කැපී පෙණේ. එලෙස නිර්මාණශීලී හා අභියෝගාත්මක දායකත්වයක් ලබා දුන් පුද්ගලයන් අතර සිවිල් සමාජ හා මාධ්‍ය ව්‍යාපාරයන්හී නායකයන් ලෙස කටයුතු කළ පාක්‍යසෝති සරවනමුත්තු, කිංග්ස්ලි රොද්‍රිගු, සුනන්ද දේශප්‍රිය හා සුනිලා අබේසේකර යන අය කැපී පෙනේ.[7] පැෆ්රල් සංවිධානයේ ඇරඹුමත් සමඟ පසුකාලීනව විමල් ප්‍රනාන්දු මහතාගේ මූලිකත්වයෙන් නිදහස් සාධාරණ මැතිවරණ සඳහා වූ ව්‍යාපාරය (MFFE) නම් වූ සංවිධානය ද

---

[4] ජාතික ඡන්ද විමසීම් නිරීක්ෂකයෝ, XII කොටස, 1988 දෙසැම්බර් මස 19 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ දෙවැනි ජනාධිපතිවරණය පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව, 1992 මැයි.

[5] පෙර කී කණ්ඩායම මැතිවරණ නිරීක්ෂණය සඳහා සහභාගී වීමේදී ඔවුන් මැතිවරණ කොමසාරිස්වරයා හඳුනාගෙන ඇත්තේ **"රාජ්‍ය නොවන ස්වේච්ඡා කණ්ඩායමක්"** ලෙසිනි.

[6] 1999 වයඹ පළාත් සභා මැතිවරණය, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ අවසාන වාර්තාව, 74 පිටුව, CMEV ආයතනය.

[7] ඉහත සඳහන් කළ ක්‍රියාකාරීන්ට අමතරව බෝගොඩ ප්‍රේමරත්න, ෆැන්ක් ජේ, එම්.ජී.එස්.මොහිදීන්, කේ.ඩී. විජේසිංහ, බර්නඩීන් සිල්වා, පූජ්‍යඃ රතනසාර හිමි යන අය ද මුල් කාලීනව මැතිවරණ නිරීක්ෂණයේ පෙරබිම සකස් කිරීමෙහිලා විශේෂ දායකත්වයක් දක්වා ඇත.

මැතිවරණ නිරීක්ෂණයට එක් විය. අනතුරුව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් මැතිවරණ නිරීක්ෂණය සඳහා ම පිහිටු වූ ආයතනයක් ලෙස මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) පිහිටුවනු ලැබීය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය(CPA), නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) හා මානව හිමිකම් පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානය (INFORM) යන සංවිධාන තුන ඒ සඳහා මූලික විය.[8] පසුගිය දශක තුනක පමණ කාලය තුළ මෙරටේ පැවති සියලු ජාතික මට්ටමේ මැතිවරණ ආශ්‍රිතව ඇති වූ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ ඉතා ක්‍රමවත් හා අංගසම්පූර්ණ දත්ත එකතුවක් CMEV ආයතනය සතුව පවතී. එහි ඩවාත් සුවිශේෂත්වය වන්නේ මෙරටේ ප්‍රථම වරට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳව වාර්තාකරණය ගූගල් සිතියමක්[9] හරහා ඉදිරිපත් කිරීම ද ඇතුලත්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා වාර්තාකරණය සඳහා සමාජ ජාලා මාධ්‍ය උපරිම ආකාරයෙන් උපයෝගී කර ගැනීමයි.[10] එය පසුගිය ජනාධිපතිවරණයේදී වඩාත් ක්‍රමවත්ව උපයෝගී කර ගන්නා ලද අතර යම් ප්‍රචණ්ඩක්‍රියාවක් සිදු වූ සැනින් එය "ට්විටර්" මාධ්‍ය හරහා දැනුම්දීම ප්‍රථමවරට ඉතා සාර්ථකව අත්හදා බලන ලද්දේ එම ආයතනයයි.[11] අද වන විට මෙරටේ මැතිවරණ නිරීක්ෂණය සඳහා දායක වී සිටින ආයතන සංඛ්‍යාව 7ක් පමණ වේ.

- ✓ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
- ✓ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
- ✓ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE)
- ✓ නිදහස් සාධාරණ මැතිවරණ සඳහා වූ ව්‍යාපාරය (MFFE)
- ✓ ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL)
- ✓ මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
- ✓ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TI-SL)

ඉහත සඳහන් කළ මැ.නි ආයතන වලට අමතරව මානව අයිතිවාසිකම් සඳහා විද්වතුන්ගේ මැතිවරණ නිරීක්ෂණ ජාලය (NEM-IHR), ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා දෙටු පුරවැසි සම්මේලනය, දිරිය පදනම ආදී සංවිධාන වරින් වර මැ.නි ක්‍රියාවලිය සඳහා දායක වී ඇත. එහෙත් තම ආයතන ඇරඹූ දා පටන් ම, මැතිවරණ කාලසීමාවට අමතරව ද ඡන්දදායකයන් දැනුම්වත් කිරීම ද ඇතුළු මෙරටේ සමස්ත මැතිවරණ ක්‍රියාවලියේ උන්නතිය උදෙසා පැෆ්රල් සංවිධානය හා සී.එම්.ඊ.වී යන ආයතන තම ක්‍රියාකාරී මැදිහත් වීම අද දක්වා ද සිදු කරමින් සිටී.

## <u>නීතිමය පසුබිම හා අනුමැතිය:</u>

මැතිවරණයක් සඳහා අදාළ නිල නිවේදනය නිකුත් කිරීමේ දින සිට, මහජන නියෝජිතයන් තෝරාපත් කර ගත් බවට නිකුත් කරනු ලබන ගැසට් නිවේදනය දක්වා වූ කාල සීමාව තුළ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් තම කාර්යභාරය ඉතා පුළුල් පරාසයක ඔස්සේ දැඩි නිරීක්ෂණාත්මක ප්‍රවේශයක් මත සිට ක්‍රියා කළ යුතුය. ඊට අමතරව මැතිවරණ නොපැවැත්වෙන කාල සීමාවන් වලදී පවා මැතිවරණ ප්‍රතිසංස්කරණ ඇතුළු මැතිවරණ ක්‍රියාවලියට අදාළව කළයුතු දෑ හා කළ හැකි දෑ අපමණය. එහිලා යම් නීතිමය පිළිගැනීමක් මැතිවරණ නිරීක්ෂණය උදෙසා අපේක්ෂා කිරීම සාධාරණ කරුණකි. මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ව්‍යාපාරයේ සමාරම්භය සිදු වූ 80 දශකයේ සිටම ඊට අදාළ ව්‍යවස්ථාපිත නීතියක් හෝ පුළුල් නීතිමය ආවරණයක් නොපැවතිණි. එහෙත් එය පුරවැසි ක්‍රියාකාරීත්වයක් ලෙස අඛණ්ඩව සිදු වී ඇත.[12] එලෙස සිවිල් සමාජය මැතිවරණ

---

[8] CMEV ආයතනය තම නිරීක්ෂණ කටයුතු ඇරඹූ අවස්ථාවේ සිටම සෑම මැතිවරණයක් අවසන ඊට අදාළ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ අංග සම්පූර්ණ වාර්තාවක් ප්‍රධාන භාෂ තුනෙන්ම ඉදිරිපත් කිරීම සාම්ප්‍රදායිකව සිදු කරනු ලබයි. එහි සුවිශේෂත්වය වන්නේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා යම් ක්‍රමවේදයක් ඔස්සේ වගු ගත කරමින් ඉදිරිපත් කිරීමයි. එලෙස මුල් කාලීනව එවන් ප්‍රවේශයක් හඳුන්වාදීමේදී ආචාර්ය අර්ජුන පරාක්‍රම හා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු යන අය මූලික වී ඇත. (*www.cmev.org*)

[9] https://www.google.com/maps/d/u/0/viewer?mid=1UfWZkKRs1m1ekaRe05YMF5lsPdY

[10] https://cmev.files.wordpress.com/2015/06/final-report-presidential-election-2015_cmev.pdf

[11] https://twitter.com/cmev

[12] අද වන විට මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන යම් නිරීක්ෂණ ආයතනයක් වේද, එකී ආයතනය තම ක්‍රියාවලිය තුළට බද්ධ කර ගනිමින් පුළුල් කාර්යයභාරයක් මැතිවරණ කොමිෂන් සභාව සිදු කරනු ලබයි. එහිලා ප්‍රධාන අංගයක් වන්නේ

නිරීක්ෂණයේ නිරත වීම තමන් කරනු ලබන සේවාව තවත් පහසු කරන්නක් ලෙස එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව සිතූ බවක් පෙනීයයි. එහෙත් යම්යම් අවස්ථාවලදී බොහෝ විට ජාතික මට්ටමේ මැතිවරණ අතරතුර රටේ පාලනයට සම්බන්ධ ප්‍රධාන දේශපාලන පක්ෂ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ඒවායේ ප්‍රධානීන් හට චෝදනා එල්ල කිරීම සිදු වී ඇත්තා සේම ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට කරන ලද තර්ජනය කිරීම්ද වාර්තා වී ඇත. වයඹ පළාත් සභා ඡන්ද විමසීමේ නිරීක්ෂණ කටයුතු වල නිරත වූ ආචාර්ය සරවනමුත්තු ප්‍රධාන ක්‍රියාකාරීන් හට සාපරාධී අපහස චෝදනා යටතේ නඩු පවරන බවට එවකට පැවති පොදු පෙරමුණු රජයේ ලේකම් දි.මු. ජයරත්න මහතා කරන ලද ප්‍රකාශය එවැන්නකි.[13] 80 දශකයේ සිට අද දක්වා ද ඊට අදාළ ක්‍රමවත් නීතිමය රාමුවක් සැකසී නොතිබීම බලවත් අඩුපාඩුවක් සේ දැක්විය හැකිය.කෙසේ නමුත් මෑතකාලීනව ශ්‍රී ලංකාව සාමාජික රටක් ලෙස කටයුතු කරනු ලබන ජාත්‍යන්තර සංවිධාන හා ක්‍රියාත්මක කිරීමට එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන් පිළිබඳව සලකා බැලීමේදී පැහැදිලි වන කරුණක් ඇත. එනම් මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය උදෙසා යම් පිළිගත් නීතිමය ආවරණයක් නොමැති වීම එතරම් සුභවාදී ප්‍රවේශයක් නොවන බවයි. එලෙස නීතිමය ආවරණයක් නොමැති වීම කැපී පෙණෙන දුර්වලතාවක් ලෙස දෘශ්‍යමාන නොවීමට හේතු වී ඇත්තේ මැතිවරණ දෙපාර්තමේන්තුව මෙතෙක් පැවති සෑම මැතිවරණයකදීම පාහේ දේශීය හා විදේශිය නිරීක්ෂකයන් කෙරෙහි ඉතා සුභවාදී ආකල්පයකින් කටයුතු කිරීමයි. තවද මෑත කාලීනව පැවති ජාතික මට්ටමමේ මැතිවරණ දෙක තුළදීම, නිරීක්ෂණ සංවිධානයන්හි කාර්යභාරය තුළ යම් සුවිශේෂත්වයක් දිස් වූ බව දැක්වීම අතිශෝක්තියක් නොවේ.

මැතිවරණ නිරීක්ෂණය සඳහා යම් නිල පිළිගැනීමක් අවශ්‍ය ය යන්න මෙරටේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් බොහෝ කලෙක පටන් සිදු කරන ලද ඉල්ලීමකි. ඊට අදාළ කරුණු සලකා බලා වසර 2004 දී පමණ අදාළ නිල අවසරය ලබා දීමට මැතිවරණ දෙපාර්තමේන්තුව ක්‍රියාකරන ලදි මෙම තීරණය ගන්නා ලද්දේ එවකට මැතිවරණ කොමසාරිස්වරයා ලෙස කටයුතු කළ දයානන්ද දිශානායක මහතාගේ කාල සමය තුළදීය. දයානන්ද දිශානායක මහතා එසේ මැතිවරණ නිරීක්ෂණය සඳහා තම නිල අවසරය ලබා දුන් නිරීක්ෂණ ආයතන දෙක වූයේ පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන ආයතන දෙකයි. එවැන්නක් සඳහා ව්‍යවස්ථාපිත බලයක් නොමැති විටෙක නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා තමන් වෙත පැවරී ඇති බලය උපයෝගී කර ගනිමින් ඔහු විසින් ගන්නා ලද එකී පියවර ප්‍රශංසාත්මක බව මේ අනුව පෙනී යයි.
එතැන් පටන් පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන ආයතන දෙක මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිල අවසරයත් සමඟ වඩාත් පුළුල්ව තම මැතිවරණ නිරීක්ෂණයට කටයුතු සිදු කරමින් තිබෙන බව පෙනී යයි. වර්තමානයේ දී ද මැතිවරණ කාල සීමාවකදී දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයක් වෙත තම නියෝජිතයන් නිරීක්ෂණය සඳහා අනුයුක්ත කිරීමේ නිල අවසරය ලැබී ඇති නිරීක්ෂණ ආයතන වන්නේ පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන ආයතන දෙක පමණි.[14] අනෙකුත් නිරීක්ෂණ ආයතන වලට ද යම්යම් සීමාවන් යටතේ අඩුවැඩි වශයෙන් තම නිරීක්ෂකයන් මැතිවරණ පැවැත්වෙන කාලසීමාවන් තුළ අනුයුක්ත කිරීමේ අවකාශය ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි තම "ජනාධිපතිවරයා හෝ පාර්ලිමේන්තු නියෝජිතයන් තේරීමේ දී ඡන්දය දීම නිදහස්ව ද, සමානව ද, රහසේ ද, විය යුත්තේය." එවන් පුළුල් ක්‍රියාදාමයක ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය සඳහා යම් නීතිමය ප්‍රතිපාදනයක් මෙරටේ හඳුන්වා දී නොතිබීම යම් තරමකට විවාදාත්මක කරුණක් ව පවතී. එකී කරුණ එලෙසම පැවතිය දී, මැතිවරණ කළමණාකරන ආයතනයක් ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුව මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියට නව මානයක් එක් කරමින් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය සඳහා ද දේශීය නිරීක්ෂකයන්ට

---

ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දෙමින් ඊට අනුගතව කටයුතු කිරීම සඳහා නිරීක්ෂණ සංවිධාන දිරිමත් කිරීමයි. ඉහත කී රාජ්‍ය නොවන ස්වේච්ඡා කණ්ඩායමේ පළමු උත්සාහය තුළට ද යම් උපදෙස් මාලාවක් ඇතුළත් වී තිබුණි. එහි ප්‍රධාන අංග වූයේ: රාජ්‍ය නොවන සංවිධානයේ දිස්ත්‍රික්ක නියෝජිතයා විසින් අත්සන් කරන ලද හැඳුනුම් පතක් වෙත නිකුත් කිරීම, එවැනි පුද්ගලයන් පිළිබඳ දිස්ත්‍රික් ලැයිස්තුවක් ලබා දීම, ඔවුන්ට ඡන්ද පොළවල් වලට හෝ ගණන් කිරීමේ මධ්‍යස්ථාන වලට ඇතුළු වීමට නොහැකි වීම, අවශ්‍ය වෙතොත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ ක්ෂේත්‍ර සහකාර තේරීම් භාර නිලධාරයා වෙත පණිවුඩයක් යවන ලෙස ඔවුන්ට දැනුම් දී තිබීම සහ පොලීසියේ සහාය අවශ්‍ය වෙතැයි සළකන වැදගත් කමකින් යුතු අවස්ථාවක් වේ නම් ජංගම පොලිස් සේවාව වෙත යොමු කිරීමට ද කටයුතු කිරීම ආදිය වේ. ජාතික ඡන්ද විමසීම් නිරීක්ෂකයෝ, XII කොටස, 99 පිටුව,1988 දෙසැම්බර් මස 19 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ දෙවැනි ජනාධිපතිවරණය පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව, 1992 මැයි.

[13] නිරීක්ෂකයන්ට නඩු පැවරීම 'ආටිකල් 19' හෙළා දකී. ලංකාදීප, සැප්, 17, 1999.
[14] 2015 මහ මැතිවරණයේ දී ඡන්ද මධ්‍යස්ථාන 12,314 ක් පමණ ස්ථාපිතව පැවතුණි.

අවස්ථාව ලබා දෙන ලදී. එයද මෙරටේ සිවිල් සමාජ සංවිධානයන්හී දීර්ඝ කාලීන ඉල්ලීමකි. වසර 2015 ජනවාරි මස 08 වැනි දින පැවති ජනාධිපතිවරණයේදී මෙලෙස ගණන් කිරීමේ මධ්‍යස්ථාන 300ක් සඳහා ප්‍රවේශ වීමේ පහසුකම් ප්‍රථම වරට සළසනු ලැබීය.[15]

මෙසේ මැතිවරණ නිරීක්ෂණය යන්න මෙරටේ ව්‍යවස්ථාපිත අයිතියක් නොවුන ද ඕනෑම රාජ්‍යයක කටයුතු සඳහා සම්බන්ධ වීමේ පුරවැසියන් සතු අයිතිය ශ්‍රී ලංකාව ද පාර්ශවකරුවෙක් වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) මඟින් පිළිගෙන ඇත. ඊට අමතරව පුරවැසි සංවිධාන මඟින් සිදු කරන අපක්ෂපාතී මැතිවරණ නිරීක්ෂණය හා සුපරීක්ෂණය පිළිබඳ මූලධර්ම පිළිබඳ සම්මුතියේ ද අපක්ෂපාතී මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගීත්වය දැක්වීම ද පුරවැසි ක්‍රියාකාරීත්වයක් ලෙස හඳුනා ගෙන ඇත.[16] ඡන්දය භාවිතා කිරීමේදී හා ගණන් කිරීමේ දී ස්වාධීන සුපරීක්ෂාවක් පැවතිය යුතු බව මෙකී ප්‍රකාශනය මඟින් අවධාරණය කර තිබීම විශේෂත්වයකි. එපමණක් නොව ශ්‍රී ලංකාව අන්තර් පාර්ලිමේන්තු සංගමයේ ද සාමාජික රටකි. (Inter Parliamentary Union - IPU) එහි නිදහස් හා සාධාරණ මැතිවරණයකට අදාළ නිර්නායක හඳුන්වාදීමේ දී ද ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයන්ගේ මැදිහත් වීම අනිවාර්ය කර ඇත.

## ජාත්‍යන්තර හා දේශීය නිරීක්ෂකයන්:

මැතිවරණ දෙපාර්තමේන්තුව දේශීය නිරීක්ෂකයන් සඳහා තම නිල අනුමැතිය ලබා දීමට වසර 2004 දී පමණ පියවර ගත්ත ද ඊට පෙර සිට ම ජාත්‍යන්තර නිරීක්ෂකයන් හට නිරීක්ෂණ පහසුකම් ලබා දිමට පියවර ගෙන තිබුණි. ඒ අනුව පොදු රාජ්‍ය මණ්ඩලය හා යුරෝපා සංගමය නියෝජනය කරමින් පැමිණි විදේශීය නිරීක්ෂකයන්ට අමතරව වර්තමානය වන විට තවත් විදේශීය නිරීක්ෂණ සංවිධාන රාශියක් මෙරටේ මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගීත්වය දක්වමින් සිටී තවද ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංගමය ද (Association of Asian Election Authorities - AAEA) අඛණ්ඩව මැතිවරණ දෙපාර්තමේන්තුව හා එක්ව මෙරටේ නිරීක්ෂණ කටයුතු සඳහා තම සහභාගීත්වය දක්වා ඇත. ඊට අමතරව පැෆ්රල් සංවිධානය හා සී.එම්.ඊ.වී ආයතනය ද බොහෝ කලෙක පටන් විදේශීය නිරීක්ෂකයන්ගේ සේවය ලබා ගැනීම සාම්ප්‍රදායික ව සිදු කරනු ලබයි. බොහෝ දුරට පාර්ලිමේන්තු මහා මැතිවරණය හා ජනාධිපතිවරණය වැනි ජාතික මට්ටමේ මැතිවරණ සඳහා නිරීක්ෂණයට එක්වන ප්‍රකට කලාපීය නිරීක්ෂණ සංවිධානයක් වන්නේ නිදහස් මැතිවරණ සඳහා ආසියානු ජාල පදනමයි. (Asian Network For Free Election (ANFREL Foundation). ඊට අමතරව කැනඩාවේ Forum of Federations ආයතනය, සී.එම්.ඊ.වී සංවිධානය හා එක්ව යුරෝපීය නිරීක්ෂකයන්, ජාතික මැතිවරණ සඳහා යොමු කිරීමේ කාර්යභාරය බොහෝ කලෙක පටන් සිදු කරයි. මැතිවරණ කොමිසම දකුණු ආසියානු මැතිවරණ කළමනාකරණ ආයතන සංසදයේ (FEMBOSA) සාමාජික ආයතනයක් බැවින් එකී සංසදය, මෙරටේ මැතිවරණ නිරීක්ෂණය සඳහා එක්වීම නිරන්තරයෙන් සිදු වේ. ශ්‍රී ලංකාවේ අවසන් වරට පැවති මහ මැතිවරණය යනු ඉතා ඉහළ සංඛ්‍යාවක විදෙස් මැතිවරණ නිරීක්ෂකයන් පිරිසක් සහභාගී වූ මැතිවරණයයි. මේ සඳහා සී.එම්.ඊ.වී හා පැෆ්රල් සංවිධානයට අමතරව මැතිවරණ දෙපාර්තමේන්තුව ආරාධනා කොට තිබූ විදෙස් නිරීක්ෂකයන් සංඛ්‍යාව 40 ක් පමණ විය. ඊට අමතරව යුරෝපා සංගමයේ අනුග්‍රහයෙන් නිරීක්ෂණයට 150 ක විදේශීය නිරීක්ෂකයන් ප්‍රමාණයක් එක් වූහ.[17]

---

[15] 2015 පැවති ජනාධිපතිවරණය හා මහ මැතිවරණය යන මැතිවරණ දෙකේ දී 1600 ක් බැගින් වූ ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාවක් (තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන 312 ක් බැගින් ද ඇතුළත්ව) මැතිවරණ දෙකේදීම දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කොට තිබුණි. ගණන් කිරීමේ ඡන්ද මධ්‍යස්ථාන 5කට එක් නිරීක්ෂකයෙක් වන සේ මධ්‍යස්ථාන 300ක් සඳහා තම නියෝජිතයන් අනුයුක්ත කිරීමේ අවකාශය මෙහිදී ලබා දෙන ලද අතර පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන නිරීක්ෂණ ආයතන දෙක ඇතුළු අනෙකුත් නිරීක්ෂණ සංවිධාන අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුක්තව නිරීක්ෂකයන් අනුයුක්ත කිරීම සිදු කරන ලදී.

[16] Global Network of Domestic Election Monitors (2012) Declaration of Global Principles for Non- Partisan Election Observation and Monitoring by Citizen Election Observers and Monitors.

[17] ඉහතින් සඳහන් කළ ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වලට අමතරව දැනට ක්‍රියාත්මක තවත් කාලාපීය මැතිවරණ නිරීක්ෂණ ජාල කිහිපයක් මෙහි දැක්වේ : Global Network of Domestic Election Monitors (GNDEM), Asian Network for Free and Fair Elections (ANFREL), Southern African Development Community Election Support Network (SADC ESN), West Africa Election Observers Network (WAEON), East and Horn of Africa

මැතිවරණ නිරීක්ෂණ සඳහා විදෙස් නිරීක්ෂකයන්ගේ මැදිහත් වීම හැමවිට ම විවාදාත්මක ය. ඉන්දියාව වැනි රටක් ඊට අවසර ලබා නොදෙන අතර තවත් බොහෝ රටවල් විදෙස් නිරීක්ෂකයන්ගේ ආගමනය නිරන්තරයෙන් අපේක්ෂා කරන බව පෙනී යයි. විදෙස් නිරීක්ෂකයන් මෙරටේ මැතිවරණ නිරීක්ෂණය සඳහා එක්වීම ආකස්මික ව සිදු වූවක් නොවේ. එය ආරම්භයේදී ඉතා අභියෝගාත්මක කාර්යයක් වු අතර එතෙක් පැවති මැතිවරණ යාන්ත්‍රණයට ඔවුන් හරහා යම් හානියක් වේදැයි යන සැකය සියලු පාර්ශව වෙත පැවතිණි. එලෙස සංවිධානාත්මක ව විදෙස් නිරීක්ෂකයන් මෙරටේ මැතිවරණ නිරීක්ෂණයට එක් වු පළමු මැතිවරණය වුයේ 1988 දෙසැම්බර් මස 19 වැනි දින පැවති දෙවැනි ජනාධිපතිවරණයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වැනි ව්‍යවස්ථාව යටතේ මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති බලතල අතර මැතිවරණ නිරීක්ෂණය බලාත්මක කිරීමේ යම් නීතිමය ප්‍රතිපාදනයක් සඳහන්ව නැත. එවැනි පරිසරයක විදෙස් නිරීක්ෂකයන්ගේ ආගමනය සඳහා පහසුකම් සැළසීම ගැටළුකාරී විය. එනමුත් එය, මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය  වඩාත් ප්‍රශස්ත මට්ටමක් කරා ගෙන යන්නක් ය යන සුභවාදී ආකල්පය එවකට මැතිවරණ කොමසාරිස්වරයා වූ ආර්.කේ චන්ද්‍රානන්ද ද සිල්වා මහතා සතුව පැවතිණි. ඒ අනුව පළමු විදෙස් නිරීක්ෂණ කණ්ඩායම මෙරටේ මැතිවරණ නිරීක්ෂණයට එක් වීමේ ඉඩකඩ විවර විය.[18] මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් බැහැරව එකී උත්සාහය සඳහා සක්‍රියව මැදිහත් වූ පිරිස වූයේ තානාපති නෙවිල් කනගරත්න, ආචාර්ය නීලන් තිරුචෙල්වම්, ජෙහාන් පෙරේරා හා ජීවන් ත්‍යාගරාජා යන අයයි.[19]

අද වන විට මැතිවරණ සඳහා සහභාගී වන දේශීය නිරීක්ෂකයන් වෙත යම් සාධනීය පිළිගැනීමක් ලැබී ඇති අතර ඔවුන් මෙරට මැතිවරණ ක්‍රියාවලියේ කැපී පෙණෙන පාර්ශවකරුවෙක් බවට පත් වී ඇත. ඊට සමගාමීව දෙස් විදෙස් නිරීක්ෂකයන්ගේ මැතිවරණ නිරීක්ෂණය පිළිබඳ ඒකමතික අදහසක් දේශපාලන සමාජයේ නොපවත්නා බව ද සටහන් කොට තැබිය යුතුය. මෙරටේ, පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණය ද වන්නේ ප්‍රතිවිරුද්ධ පක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂය බලයට පත් වූ විට තමන් එතෙක් මැතිවරණ නිරීක්ෂණයන් වෙත දැක් වූ දේශපාලනික සහයෝගය සපුරා නවතා දැමීමේ නිශේධනාත්මක ආකල්පයයි. එපමණක් නොව ඔවුන් තම ප්‍රතිවාදී සතුරන් පිරිසක් ලෙස දැකීමේ දේශපාලන භාවිතාවක් ද වරින්වර දේශපාලන පක්ෂ තුළින් විද්‍යාමාන වීම සාමාන්‍ය කරුණක් බවට පත් ව ඇත.

විදෙස් නිරීක්ෂකයන්ගේ පළමු සංවිධානාත්මක මැතිවරණ නිරීක්ෂණ මෙහෙවර සඳහා පහසුකම් සැළසූ ආකාරයට ම මැතිවරණ දෙපාර්තමේන්තුව දෙවැනි ජනාධිපතිවරණය පැවති කාලසමය තුළ දේශීය මැතිවරණ නිරීක්ෂණ ආයතන සඳහා තම කැමැත්ත ප්‍රකාශ කිරීම කැපී පෙනේ. සිවිල් සමාජ සංවිධාන 20 ක් පමණ මේ සඳහා සහභාගී වූ අතර මැතිවරණ දිස්ත්‍රික්ක 18 ක් ඔවුන්ගේ නිරීක්ෂණයට බඳුන් විය. අදාළ පාර්ශවයන්ගේ නිසි සහයෝගය සහතික කිරීම මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ ද ඡන්ද මධ්‍යස්ථාන වෙත ඇතුළුවීමේ නිල අවසරය ඔවුන්හට නොලැබිණි.

නවීන ප්‍රජාතන්ත්‍රවාදය තුළ රටක මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා නිරීක්ෂණ සංවිධානයක කාර්යභාරය දෙයාකාරයකින් විග්‍රහ කළ හැකිය. එක් පසෙකින් බලපෑම් කණ්ඩායමක් (Pressure Group) ලෙස මැතිවරණයක හෝ සමස්ත ක්‍රියාවලියේ සුභවාදී වෙනසක් සඳහා මැදිහත් වීම එහිලා ප්‍රමුඛය. ඊට සමගාමීව මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දිශානතිය වඩාත් ජනහිතකාමී හා පුළුල් ජනතා නියෝජනයක් සඳහා යොමුකරලීමේ පහසුකාරත්වය දැක්වීම ද, ඔවුන් හට කළ හැකි අනෙක්

---

Election Observers Network (E-HORN), Acuerdo de Lima, European Network of Election Monitoring Organizations (ENEMO), Arab Network for Democratic Elections (ANDE), Election Network in the Arab Region (ENAR), European Platform for Democratic Elections (EPDE)

[18] පළමු නිරීක්ෂණ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව 16 ක් වූ අතර ඔවුන් නියෝජනය කළ රටවල් වුයේ බංගලාදේශය, ඉන්දියාව, නේපාලය හා පාකිස්තානය යන රටවල්ය.

[19] 1988.12.19 දින පැවති ශ්‍රී ලංකාවේ ii ජනාධිපතිවරණය පිළිබඳ මැතිවරණ කොමසාර්ස්වරයාගේ වාර්තාව, පිටුව 82, 1993 සැසි වාර්තා අංක iv

තීරණාත්මක කාර්යභාරයයි. පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන ආයතන ප්‍රමුඛ ව මෙරටේ මැතිවරණ නිරීක්ෂණ ආයතන මැදිහත් නොවන්නට අදටත් නිදහස් හා සාධාරණ ඡන්දයක් පැවැත්වීමෙහිලා අවැසි බලය මැතිවරණ කොමිෂන් සභාව සතු නොවන්නට තිබූ ඉඩකඩ බොහෝය. ඡන්ද අක්‍රමිකතා වැළැක්වීමෙහිලා ගන්නා සාධනීය පියවරක් වූ ජාතික හැඳුනුම්පත ඡන්දයකදී අනිවාර්ය වීම සිදු වූයේ පැෆ්රල් සංවිධානය, ඒ සඳහා අධිකරණයේ පිහිට පැතීම හේතුකොට ගෙනය. යම් ඡන්ද මධ්‍යස්ථානයක සිදු වූ බරපතල ඡන්ද අක්‍රමිකතාවක් හේතුවෙන් එකී ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය ශුන්‍ය කොට (Annulled) නැවත ඡන්දයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් පැන නැඟුණ ද එවකට කටයුතු කළ මැතිවරණ කොමසාරිස්වරුන් හට එවන් ක්ෂණික තීරණයක් ගැනීමේ බලයක් නීතියෙන් ලබා දී නොතිබුණි. සී.එම්.ඊ.වී ආයතනය, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොණු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් සළකා බලා ලබා දුන් තීන්දුව මගින් මැතිවරණ කොමසාරිස්වරයා සතු බලතල වඩාත් පුළුල් වූවා සේම අද ද ඡන්ද අක්‍රමිකතාවක් සිදු වූ විටෙක, කවර හෝ ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද ශුන්‍ය කිරීම සිදු වන්නේ එකී මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. එකී අධිකරණමය ක්‍රියාමාර්ග වලට අතිරේකව මෙරටේ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ මාර්ග සිතියම සැකසීමේ පුරෝගාමී මෙහෙවරක් නිරීක්ෂණ සංවිධාන විසින් සිදු කර ඇත. වරෙක "සංවාදයෙන් ක්‍රියාකාරීත්වය" නමින් මැතිවරණ ප්‍රතිසංස්කරණ උදෙසා පුරවැසියන්ගේ දායකත්වය එක්කළ මෙකී සංවිධාන අද ද පුරවැසියන්ගේ පුළුල් දේශපාලනික අභිලාශයන් හා සැසඳෙන්නා වූ මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් උදෙසා කටයුතු කරමින් සිටීම සුභවාදී ලක්ෂණයකි. මැතිවරණ දෙපාර්තමේන්තුව හා නිරීක්ෂණ සංවිධාන ඒකාබද්ධ ව බිහිකරන ලද සුවිශේෂි යාන්ත්‍රණයකට කදිම නිදසුනක් වන්නේ අද ඉතා ඵලදායීව මැතිවරණ දිනයේ ක්‍රියාත්මක වන මැතිවරණ පැමිණිලි පිළිබඳ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයයි. එය වසර 2001 දී පමණ ඇරඹුණු අතර මෙකී මධ්‍යස්ථානයේ මුලික කාර්යභාරය වන්නේ මැතිවරණ දිනයේදී දිවයිනේ සිව්දෙසින් වාර්තා වන මැතිවරණ ආශ්‍රිත සිද්ධීන් ක්ෂණිකව විසදීම සඳහා පියවර ගැනීමයි. මැතිවරණ කොමසාරිස්වරයාගේ මුලිකත්වයෙන් හා අනෙකුත් අදාළ සියලු පාර්ශවයන්ගේ මැදිහත් විමෙන් මෙකී ක්‍රියාවලිය මෙතෙක් ඉතා සාර්ථකව ක්‍රියාවට නැගී තිබේ. මැතිවරණ දෙපාර්තමේන්තුව, ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් බවට පත්වීමෙහිලා පෙරබිම සකස් කිරීමේදි මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සතුව ද පැවති භූමිකාව තීරණාත්මක විය. එය සිවිල් සමාජයේ දිගුකාලීන අපේක්ෂාවක ප්‍රතිඵලයක් වූ අතර ඊට ආවේණික ස්වාධීනත්වයෙන් හා නිසි දැක්මකින් යුක්තව කටයුතු කිරීම සඳහා නිරීක්ෂණ සංවිධාන දායකත්වය තවදුරටත් අවශ්‍ය කෙරේ.

මහත්මා ගාන්ධිතුමන් වරෙක පැවසුවේ "ප්‍රජාතන්ත්‍රවාදයෙහි ජීවගුණය බාහිරන් අරෝපණය කළ නොහැකි බවත්, එය තමන් තුළින් ම ලඟා කරගත යුතු බවත් ය". ඒ අනුව පුරවැසි සමාජයේ යහපත් ප්‍රතිචාර පවතින තාක්කල් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ක්‍රියාකාරීත්වය අඩපණ කළ නොහැකි අතර එහි ජීවගුණය රඳා පවතින්නේ විවිධ අනන්‍යතාවන්ගෙන් යුත් රටවැසියන්ගේ විවිධත්වය වටහා ගැනීම හා ඔවුන්ගේ සමාජ දේශපාලනික පැවැත්මට අදාළ සැබෑ ගැටළු ආමන්ත්‍රණය කිරීම තුළිනි.

මෙරටේ නිරීක්ෂණ සංවිධාන වෙත එල්ල වන චෝදනා අතරින් එකක් වන්නේ මැතිවරණ ආශ්‍රිත සිද්ධීන් වාර්තා කිරීමේදී එක්එක් සංවිධාන මඟින් නිකුත් කරන සංඛ්‍යාත්මක දත්ත අතර පවත්නා පරස්පරතාය. එවැනි සිදුවීම් වාර්තා කිරීමේ දී ඒවා, ඊට අදාළව දත්ත නිකුත් කරන වෙනත් නිල ආයතන වන පොලිස් දෙපාර්මේන්තුව හෝ මැතිවරණ කොමිෂන් සභාවේ නිල සංඛ්‍යා දත්ත හා සමගාමී නොවිය හැකිය. එවැනි පරස්පරතා සංවිධානාත්මකව හෝ චේතානාන්විතව සිදු නොවන්නා සේම කිසිදු නිරීක්ෂණ ආයතනයක් සාවද්‍ය තොරතුරු සමාජගත කරමින් තම කීර්තිය අහිමි කර ගැනීමට අපේක්ෂා නොකරනු ඇත.

## මැතිවරණ නිරීක්ෂණ ආයතන මැතිවරණ ආශ්‍රිත සිදුවීම් වාර්තා කළ ආකාරය

**මූලාශය:** *පැෆ්රල් හා CMEV යන ආයතන මගින් අවසන් පාර්ලිමේන්තු මහා මැතිවරණ 03 අවසානයේ නිකුත් කරන ලද අවසන් වාර්තා ඇසුරෙනි.*

| පාර්ලිමේන්තු මහා මැතිවරණය පැවති වර්ෂය හා දිනය | PAFFREL මගින් වාර්තා කළ **පූර්ව** මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සංඛ්‍යාව | CMEV මගින් වාර්තා කළ **පූර්ව** මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සංඛ්‍යාව | PAFFREL මගින් **මැතිවරණ දින** වාර්තා කළ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සංඛ්‍යාව | CMEV මගින් **මැතිවරණ දින** වාර්තා කළ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **2004 අප්‍රේල් 02** | **293** | **1747** | **100** | **448** |
| **2010 අප්‍රේල් 08** | **313** | **414** | **108** | **524** |
| **2015 අගෝස්තු 17** | **1096** | **918** | **211** | **335** |

එහෙත් සමහර සංවිධාන හෝ ක්‍රියාකාරීන්ගේ දේශපාලන ලැදියාවන් හා පක්ෂපාතීකම් පිළිබඳ නැගෙන යම්යම් චෝදනා පහසුවෙන් බැහැර කළ නොහැකිය. එහිලා මැතිවරණ කොමිෂන් සභාවේ මැදිහත්වීම තීරණාත්මකය. ඡන්දදායකයන්ගේ දැනුම්වත් කිරීම ඇතුළු නවමු ප්‍රවේශයන් ඔස්සේ නිරීක්ෂණ සංවිධාන දායකත්වය මෙරටේ මැතිවරණ ක්‍රියාවලියට එක්කර ගැනීමේ නිර්මාණශීලී භාවිතාවක් මැතිවරණ කොමිෂන් සභාව තුළ, අද වන විට දක්නට ලැබීම සුභවාදී ප්‍රවේශයකි. පැෆ්රල්, සී.එම්.ඊ.වී සහ කැෆේ ආදී නිරීක්ෂණ සංවිධාන මැතිවරණයක පැවතිය යුතු සමස්ත ක්‍රියාකාරීත්වය පිළිබඳ සැළකිලිමත් වන අතරතුර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් වැනි සංවිධාන තම අවධානය වඩාත් යොමු කරනු ලබන්නේ පොදු දේපල අයථා පරිහරණය සහ අනිසි මාධ්‍ය භාවිතාව කෙරෙහිය. ඊට අමතරව ලක්බිමේ මව්වරු හා දියණියෝ නම් වූ නිරීක්ෂණ සංවිධානයේ සමස්ත යාන්ත්‍රණය හොබවනුයේ කාන්තාවන් පිරිසක්ය. මෙලෙස ක්‍රියාත්මක මෙරටේ නිරීක්ෂණ ආයතන වඩාත් ප්‍රතිඵලදායී ඉසව්වක් කරා රැගෙන යෑමේ වගකීම ඇත්තේ පුරවැසියන් කෙරෙහිය. මෙරටේ ශ්‍රේෂ්ඨාධිකරණය අදහස් කළ පරිදි ඡන්දය භාවිතා කිරීම ද භාෂණයේ නිදහසට අදාළ තවත් එක් අංගයකි. මැතිවරණයක් යනු රටක පවත්වන සුවිශාලතම කෙටි කාලීන මිනිස් හා භෞතික පහසුකම් එකට සංයෝජනය කරමින් සිදු කරනු ලබන අති දැවැන්ත මෙහෙයුමකි. ඊට අදාළ මූල්‍ය පහසුකම් පැවතීම පමණක් නොසෑහෙන අතර අපක්ෂපාතී චාර්යාවෙන් හෙබි කාර්යක්ෂම නිළධාරීන්ගේ මැදිහත් වීම ද අනිවාර්ය කොන්දේසියකි. නිරීක්ෂණ සංවිධානයකට ද මින් ගැලවීමට නොහැක. එය මැතිවරණ කළමනාකරණ ආයතනයක් හරහා නිකුත් කරනු ලබන ආචාරධර්ම පිළිපැදීමේ සිට පුළුල් පරාසයක් ආවරණය වන නිරීක්ෂණ ජාලයක් නිර්මාණය කර ගැනීම දක්වා සපුරාලිය යුතු විසල් කාර්යභාරයකි. අද වන විට මැතිවරණ නිරීක්ෂණය මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය හා බද්ධ වී ඇති ආකාරය කෙතරම් දැයි සනාථ කරන එක් සාධකයක් වන්නේ පසුගිය පාර්ලිමේන්තු මහා මැතිවරණය සඳහා අනුයුක්ත කරන ලද නිරීක්ෂක සංඛ්‍යාව පිළිබඳ විමසීමේ දීය. ඒ අනුව, දළ වශයෙන් මෙරටේ සියළු නිරීක්ෂණ සංවිධාන මගින් යොදවන ලද නිරීක්ෂකයන් ප්‍රමාණය 25,000 ක් පමණ විය.[20] ඒසා ප්‍රමාණයක නිරීක්ෂකයන් ප්‍රමාණයක් සමස්ථ මැතිවරණය තුළ කටයුතු කළ ද ඔවුන්ගේ පක්ෂපාතීත්වය හෝ නොසැළකිලිමත්බව පිළිබඳ පැමිණිලි හෝ චෝදනා වාර්තා වී ඇත්තේ අවම වශයෙන් බව පෙනී යයි. එවන් සාර්ථක මැතිවරණ මෙහෙයුමක් සිදු කිරීමේ දී මැතිවරණ දෙපාර්තමේන්තුව ඉතා කාර්යක්ෂම සේවාවක් සළසා ඇත. එහිලා එක්එක් සංවිධාන සතු විභව ශක්තිය හා යහපත් භාවිතාවන් තම මැතිවරණ මෙහෙයුම් ක්‍රියාදාමයේ අනිවාර්ය සාධකයක් බවට පත් කර ගැනීමේ නිහතමානීත්වයක් හා පරිණත පරිපාලනමය පරිචයක් මෙන්ම උපායශීලීත්වයක් එවකට මැතිවරණ කොමසාරිස්වරයා වූ මහින්ද දේශප්‍රිය මහතා සතුව පැවති බව ද සඳහන් කිරීම උචිතය.

මෑතකාලීනව මැතිවරණ නිරීක්ෂණ ආයතන, තම නිරීක්ෂකයන් මැතිවරණ නිරීක්ෂණය සඳහා අනුයුක්ත කර ඇති ආකාරය පිළිබඳ දළ අවබෝධයක් පහත වගුව පිරික්සීමෙන් ලද හැකිය. මෙහි පළවන්නේ මෑතකාලීනව (පාර්ලිමේන්තු මහා මැතිවරණ වලදී පමණක්) පැෆ්රල් හා සී.එම්.ඊ.වී යන ආයතන ඉදිරිපත් කළ අවසන් වාර්තා පාදක කර ගනිමින් සකස් කරන ලද වගුවකි.

[20] මැතිවරණ දිනයේ දී නිරීක්ෂණ කටයුතු හා එක් වීමට ජනතාව තුළ මෑතකාලීනව බලවත් උනන්දුවක් ඇති බව පෙනී යයි. එහෙත් ඊට අදාළ ප්‍රධාන බාධකයක් වන්නේ දුරබැහැර පළාතක නිරීක්ෂණ කටයුතු වලට එක් වන පුද්ගලයන් සඳහා ඡන්දය භාවිතා කිරීමට අදාළ ක්‍රමවේදයක් මෙතෙක් සැකසී නොමැති වීමයි.

**මැතිවරණ නිරීක්ෂණ ආයතන මෑත කාලීනව පැවති ජාතික මට්ටමේ මැතිවරණ තුළදී තම නිරීක්ෂකයින් අනුයුක්ත කර ඇති ආකාරයඃ**

| මැතිවරණය පැවති වර්ෂය හා දිනය | PAFFREL මගින් මැතිවරණ කාල සීමාව තුළ යොදවනු ලැබූ ක්ෂේත්‍ර නිරීක්ෂකයින් සංඛ්‍යාව | CMEV මගින් මැතිවරණ කාල සීමාව තුළ යොදවනු ලැබූ ක්ෂේත්‍ර නිරීක්ෂකයින් සංඛ්‍යාව | PAFFREL මගින් මැතිවරණ දිනයේ යොදවනු ලැබූ ස්ථිතික (Static)නිරීක්ෂකයින් සංඛ්‍යාව | CMEV මගින් මැතිවරණ දිනයේ යොදවනු ලැබූ ස්ථිතික(Static) නිරීක්ෂකයින් සංඛ්‍යාව | PAFFREL මගින් යොදවනු ලැබූ ජාත්‍යන්තර නිරීක්ෂකයින් සංඛ්‍යාව | CMEV මගින් යොදවනු ලැබූ ජාත්‍යන්තර නිරීක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| මහ මැතිවරණය 2004 අප්‍රේල් 02 | **342** | **153** | **19,865** | **4074** | **102** | **25** |
| ජනාධිපතිවරණය 2005 නොවැම්බර් 17 | **1422** | **161** | **19,625** | **4592** | **108** | **17** |
| මහ මැතිවරණය 2010 අප්‍රේල් 08 | **1256** | **163** | **8339** | **3629** | **16** | **-** |
| ජනාධිපතිවරණය 2010 ජනවාරි 26 | **1280** | **170** | **2884** | **3500** | **14** | **18** |
| මහ මැතිවරණය 2015 අගෝස්තු 17 | **1264** | **193** | **13,034** | **3173** | **14** | **21** |
| ජනාධිපතිවරණය 2015 ජනවාරි 08 | **1549** | **180** | **11,485** | **3600** | **35** | **-** |

**මූලාශයඃ** *පැෆ්රල් හා CMEV යන ආයතන මගින් අවසන් පාර්ලිමේන්තු මහා මැතිවරණ සහ ජනාධිපතිවරණ අවසානයේ නිකුත් කරන ලද අවසන් වාර්තා ඇසුරෙනි.*

ඕනෑම මැතිවරණ ක්‍රියාවලියක සුපිළිපන්නභාවය සුරැකීමෙහිලා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මකවන මැතිවරණ නිරීක්ෂකයන් සිදු කරනු ලබන්නේ ඉතා තීරණාත්මක කාර්යභාරයකි. එය නිතැතින්ම ඕනෑම මැතිවරණයක විනිවිදභාවය හා වගවීම තහවුරු කරන්නා සේම ජනතා විශ්වාසය ද වඩාත් වර්ධනය කරන්නේය. එවන් අපක්ෂපාතී මැතිවරණ නිරීක්ෂණ කාර්යයක නිරතවීම සඳහා අවැසි පූර්ණ සහයෝගය ලබා දීම අදාළ රාජ්‍යයන්හී මැතිවරණ කළමණාකරන ආයතනයන්හී වගකීමකි. මැතිවරණ නිරීක්ෂණයට අදාළව, මැතිවරණ නිරීක්ෂණයන් සඳහා වන නීතිමය රාමුවක් මෙතෙක් ශ්‍රී ලංකාවේ සැකසී නොමැති අතර එය මෙරටේ ක්‍රියවට නැගෙනුයේ මැතිවරණ කොමිෂන් සභාවේ අභිමතයට (Discretion of Election Commission) පමණක් අනුකූල අන්දමිනි.

මෙහිලා වඩාත් සැළකිය යුතු කරුණක් වන්නේ පුරවැසියන් සතු ඡන්ද අයිතිය (Right to Vote) මූලික අයිතියක් ලෙස මෙරටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත්ව නොතිබීමයි. එලෙස ඡන්ද අයිතිය පිළිබඳ ව්‍යවස්ථාපිත සඳහනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නොවුවද මෙරටේ පළාත් සභා පහක මැතිවරණ කල්දැමු අවසථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවේදී විනිසුරු මාක් ප්‍රනාන්දු මහතා සඳහන් කරන ලද්දේ ඡන්දය ලබා දීමට ඇති අයිතිය ව්‍යවස්ථාව මගින් පිරිනමා ඇති භාෂනයේ නිදහසෙහිම ඓන්ද්‍රීය අංගයක් බවයි.[21] ඊට අමතරව මෙරටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වැනි ව්‍යවස්ථාවට අනුව ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ විය යුතු බව දක්වා ඇත.

---

[21] (…. The most effective manner, in which a voter may give expression to his views with minimum risk to himself and his family, is by silently marking his ballot paper in the secrecy of the polling booth. The silent and secret expression of a Citizen's preference as between one candidate and another by casting his vote is no leys an exercise of the freedom of speech and expression, than most eloquent speech from a political platform. To hold otherwise is to undermine the very foundation of the constitution)

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට හා ඊට සමගාමීව නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා වන මැතිවරණ ප්‍රතිසංස්කරන ක්‍රියාවලියේ දී වඩාත් සුවිශේෂී අවධානයක් යොමු විය යුතු ක්ෂේත්‍රයක් වන්නේ මැතිවරණ නිරීක්ෂණය හා එය වඩාත් ක්‍රමවත් කිරීමෙහිලා අවශ්‍යයෙන්ම අදාළ වන්නාවූ නීතිමය රාමුවක් හඳුන්වාදීමයි. එලෙස මැතිවරණ නිරීක්ෂණය හා නිරීක්ෂණයේ නිරත නිරීක්ෂකයන් හට තම නිරීක්ෂණයේ දී ලැබෙන නීතිමය ආවරණය, සුපිළිපන්න මැතිවරණ ක්‍රියාදාමයක විශ්වාසනීයත්වය තහවුරු කිරීමට හේතුවන බව ඉතා පැහැදිලි කරුණකි. නිදහස් හා සාධාරණ මැතිවරණයක් යනු හුදු එක් පාර්ශවයක හෝ පාර්ශව කිහිපයක සහභාගීත්වයෙන් හා කැපවීමෙන් පවත්වා අවසන් කළ හැකි කිසිවක් නොව, ඊට අදාළ සියලු පාර්ශවයන්ගේ අපක්ෂපාතී හා කාර්යක්ෂම සම්බන්ධීකරණයක් ඔස්සේ සාක්ෂාත් කරගත යුත්තකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාදාමය වඩාත් ක්‍රමවත් නීතිමය රාමුවක් ඔස්සේ හැඩගැස්වීම රටෙහි දිවි ගෙවන සියලු පුරවැසියන්ගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් සුරැකිය හැකි තවත් එක් සුවිශේෂී මගක් බව ඉතා පැහැදිලි කරුණකි.

මැතිවරණ නිරීක්ෂණයට අදාළ වචන කිහිපයක් පිළිබඳ පැහැදිලි කිරීමක් පහත දැක්වේ.

**මැතිවරණ දෙපාර්තමේන්තුව:** 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපිත කොට ඇත. ඒ අනුව මැතිවරණ දෙපාර්තමේන්තුව තව දුරටත් ක්‍රියාත්මක නොවේ. එහි කාර්යභාරය වඩාත් පුළුල්ව මැතිවරණ කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නැගේ.

**ස්ථිතික නිරීක්ෂකයන්:** මැතිවරණ දිනයේ දී ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡන්ද නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ සංවිධාන මඟින් අනුයුක්ත කරනු ලබන පුද්ගලයන්.

**ජංගම නිරීක්ෂකයන්:** මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථාන හා ඒ අවට කටයුතු නිරීක්ෂණ සඳහා ජංගම රථ උපයෝගී කර ගනිමින් නිරීක්ෂණයට අනුයුක්ත කළ පුද්ගලයන්.

**ක්ෂේත්‍ර සම්බන්ධීකාරවරයා:** පූර්ව මැතිවරණ, මැතිවරණ දින හා පශ්චාත් යන අවධීන් තුනම ආවරණය කරමින් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිරීක්ෂණ කටයුතු වල යොදවන පුද්ගලයන්.

***ඡායාරූපය...***

*1999 වයඹ පළාත් සභා ඡන්ද විමසීම අතරතුර මාවතගම පිහිටි ඡන්ද මධ්‍යස්ථානයක නීතිවිරෝධී ලෙස ඡන්ද පෙට්ටි පුරවන දේශපාලන ආධාරකරුවන් පිරිසක්. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජංගම නිරීක්ෂිකාවක් විසින් මෙම සිදුවීම ඡායාරූපගත කොට ඇත.*